)ීයලුම හිමිකම් ඇවිරිණි(
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# බුද්ධ ධර්මය

**6 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන් පුරවන්න.**

(වෙසක් පසළොස්වක / තව්තිසා දෙව්ලොව / ඇසළ / සහම්පතී මහා බ්‍රහ්මයා)

01 සිදුහත් බෝසතාණන් ආසන්න භවයේ සිටියේ ................................................................ ය.

02 සිදුහත් බෝසතුන්ට මනුලොව ඉපදීමට ආරාධනා කළේ ........................................................ ප්‍රමුඛ දෙවියන් ය.

03 බෝසතුන් මව්කුස පිළිසිඳගත්තේ .................................................. පොහොය දිනයේ දී ය.

04 බෝසතුන් ඉපදුනේ ................................................................................ පොහොය දිනයේ දී ය.

- **පහත සඳහන් වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

05 ශරීර ලක්ෂණ අනුව කුමරා ඒකාන්තයෙන්ම බුදුවන බව ප්‍රකාශ කළේ කොණ්ඩඤ්ඤ බමුණා ය. ( )

06 සිදුහත් කුමරු කිසාගෝතමිය සරණපාවා ගත්තේ ය. ( )

07 සියලු සතුන් කෙරෙහි මිතුරු සිතින් හිතවත්ව ක්‍රියා කිරීම මෛත්‍රියයි. ( )

08 යශෝදරා දේවියගේ පුතා ආනන්ද කුමරු ය. ( )

09 පුද්ගලයකුගේ දියුණුව සඳහා උපකාරී වන කරුණු හයක් අත්තස්සද්වාර ජාතකයේ දක්වා ඇත. ( )

10 සම්මා වාචා, සම්මා කම්මන්ත හා සම්මා ආජීව යන අංග තුන ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ ශීල ශික්ෂාවට අයත් වේ. ( )

- ''අ'' හා ''ආ'' ගැළපෙන සේ යා කරන්න.

| | ''අ'' | ''ආ'' |
|---|---|---|
| 11 | කීකරුකම, අවවාද පිළිපැදීම | ● අකුසලකර්ම |
| 12 | යහපත් වූ ක්‍රියාවන්හී නිරතවීම | ● ජාතික ගීය |
| 13 | බොරුකීමෙන් වැළකීම | ● ථූපාරාමය |
| 14 | මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා | ● අත්තූපනායික ධර්ම පරියාය |
| 15 | මහාමාර්ග ප්‍රතිසංස්කරණය, වැව් පොකුණු ඉදිකිරීම | ● රාහුල හිමි |
| 16 | එකම මවකගේ දරු පිරිසක් මෙන් ක්‍රියා කිරීම | ● අනිත්‍යතාව |
| 17 | තමන්ටත්, අනුන්ටත් අවැඩදායක ක්‍රියා | ● සම්මා කම්මන්ත |
| 18 | ලොව පවතින හැමදේකම ඇති වෙනස්වීම | ● මඝ මානවක |
| 19 | තමන් ගැන සිතා වැරදි නොකිරීම | ● සම්මා වාචා |
| 20 | දකුණු අකු ධාතුව | ● සිවු බඹ විහරණ |

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 කි. තෝරාගත් අනෙක් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගිනි.**

01 (1) ''අම්බලට්ඨික රාහුලෝවාද'' සූත්‍රය දේශනා කළේ කාටද?

(2) ''මම ලොවට අග්‍ර වෙමි. මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි.'' මෙම ප්‍රකාශය කළේ කවුද? කිනම් අවස්ථාවක ද?

(3) සිදුහත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට සහභාගී වූ පඬිවරු ගණන කීයද?

(4) වප්මගුල දා සිදුහත් කුමරා වැඩූ භාවනාව කුමක් ද?

(5) නිබ්බුත පද කීවේ කවුද?

(6) සම්පත් ආරක්ෂා කරගැනීමට අදාළව බුදුන්වහන්සේ උපදෙස් දී ඇති සූත්‍රය කුමක් ද?

(7) ''දැඩි ලෝභය විනාශයට හේතු වේ'' මෙම කියමනට අදාළ ජාතක කථාව කුමක් ද?

(8) ශ්‍රද්ධාව යනු කුමක් ද?

(9) ශ්‍රී ලංකාවේ දී පැවිදි වූ මුල්ම කාන්තාව කවුද?

(10) අපේ ජාතික පුෂ්පය කුමක් ද?

02 (1) ''මගේ අදහස ඉටුවූවාසේම ඔබේ අදහසද ඉටුවේවා.'' මෙම ප්‍රකාශය කළ තැනැත්තියගේ නම ලියන්න.

(2) ත්‍රිවිද්‍යා නම් කරන්න.

(3) සිදුහත් කුමරුගේ මහාභිනිෂ්ක්‍රමණයේ සිට දුෂ්කර ක්‍රියා දක්වා සිදුවීම් කෙටියෙන් පෙළගස්වන්න.

03 (1) සීල ශික්ෂාව දෙයාකාර වේ. ඒ දෙක නම් කරන්න.

(2) කයින් කෙරෙන වැරදි තුන දක්වන්න.

(3) සිල්වත්වීමේ වැදගත්කම කෙටියෙන් දක්වා සීලයෙහි ආනිසංස දක්වන්න.

04 (1) රාහුල හාමුදුරුවන්ට භික්ෂූන් අතර ලැබුණ අගතනතුර කුමක් ද?

(2) රාහුල හාමුදුරුවන්ගේ දින චරියාවේ ප්‍රථම කාර්යය වූයේ කුමක් ද?

(3) රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ වගුගත කරන්න.

05 (1) භාවනා කිරීමේ දී ශිෂ්‍යයකු හා ශිෂ්‍යාවක හිඳගත යුතු ආකාර දෙක ලියන්න.

(2) මෛත්‍රී භාවනාව කිරීමේ මුල් පියවර දක්වන්න.

(3) මෛත්‍රී භාවනාවේ ආනිසංස පැහැදිලි කරන්න.

06 (1) තංච කම්මං කතං සාධු යං කත්වානානු තප්පති ....... මෙම ගාථාවේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(2) මෙම ගාථාවෙන් කියවෙන අදහස දක්වන්න.

(3) සුමන මාලාකරුගේ කථා පුවත කෙටියෙන් ලියා දක්වන්න.

07 (1) ශ්‍රද්ධාව ප්‍රධාන වශයෙන් දෙයාකාර වේ. ඒ දෙක නම් කරන්න.

(2) නියම ශ්‍රද්ධාවන්තයකු තුළ තිබිය යුතු ලක්ෂණ තුනක් දක්වන්න.

(3) ශ්‍රද්ධාවන්තයකු වශයෙන් ඔබ ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරන්න.